)කථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
elephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )NA/04/Tutor/2015

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2016.12.23
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 - 87 / 2015 (3)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියලුම මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් හා අදාළ ආයතන ප්‍රධානීන් වෙත

**<u>පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුවට බඳවා ගැනීම - 2015</u>**

පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුවට බඳවා ගැනීම 2015. යන මැයෙන් නිකුත් කරන ලද 02 –87/2015 හා 2015.09.17 දිනැති චක්‍රලේඛය හා එම චක්‍රලේඛයේ වගන්ති සංශෝධනය කරමින් නිකුත් කරන ලද 02/87/2015(1) අංක හා 2015.09.29 දිනැති පොදු චක්‍රලේඛය හා 02/87/2015(2 ) අංක හා 2015.10.10 දිනැති පොදු චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය අනුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. 02 –87/2015 හා 2015.09.17 දිනැති පොදු චක්‍රලේඛයේ අංක 03 (සුදුසුකම්) යටතේ අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කල යුතු සුදුසුකම් සම්බන්ධ වගන්තියෙහි අනු අංක 03 යටතේ දක්වා ඇති සුදුසුකම වන"අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස් වීම් දිනට පෙරාතුව වූ වසරක් (01) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම"යන සුදුසුකම මෙම බඳවා ගැනීමට පමණක් අදාළ වන සේ මෙයින් ඉවත් කරනු ලැබේ.

03.එසේම අංක 02/87/2015 හා 2015.09.17 දිනැති චක්‍රලේඛයේ අංක 3.3 හි සඳහන් වන සුදුසුකම සපුරා තිබුණද/ සපුරා නොතිබුණද දැනටමත් අයදුම්පත් ඉදිරිපත්කර ඇති හෙද සේවයේ නිලධාරීන් මෙම සංශෝධිත චක්‍රලේඛය යටතේ නැවතත් අයදුම්කිරීම අවශ්‍ය නොවන අතර, ඔවුන් විසින් ඉදිරිපත්කර ඇති අයදුම්පත් මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද සේ සලකා කටයුතු කරනු ලැබේ.

04. මෙම සංශෝධිත චක්‍රලේඛය යටතේ 2015.10.31 දිනට සුදුසුකම් සම්පූර්ණකර ඇති නිලධාරීන්ට පමණක් අයදුම්පත්‍ර ඉදිරිපත් කල හැකි වේ.

05. මෙම චක්‍රලේඛය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් තමන්ගේ අයදුම්පත්‍ර අදාල ආයතන ප්‍රධානියා වෙත 2017.01.13 දින හෝ ඊට පෙර ඉදිරිපත් කල යුතු අතර ආයතන ප්‍රධානීන් විසින් අදාල අයදුම්පත්‍ර වල තම නිර්දේශය සටහන් කර 2017.01.18 දින හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතුය. යුතුය.

අධ්‍යක්ෂ පාලන ,01
සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය "
අංක ,385
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10

06. එසේම 02 –87/2015 හා 2015.09.17 දිනැති චක්‍රලේඛයෙහි හා එම චක්‍රලේඛයේ වගන්ති සංශෝධනය කරමින් නිකුත් කරන ලද අංක 02/87/2015(1) හා 2015.09.29 දිනැති පොදු චක්‍රලේඛයෙහි සහ අංක 02/87/2015(2 ) අංක හා 2015.10.10 දිනැති පොදු චක්‍රලේඛය හි සඳහන් අනිකුත් විධිවිධාන නොවෙනස්ව පවති.

07. මෙම චක්‍රලේඛයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි.

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය,පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.